# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2325/85 - 2023 අප්‍රේල් මස 01 වැනි සෙනසුරාදා - 2023.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

### 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 154 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 157 වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 153 වගන්තිය යටතේ සඳහන් බලතල ප්‍රකාරව පැලියගොඩ නගර සභාව විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි විස්තර වන අතුරු ව්‍යවස්ථා සඳහා බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 154 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී (ගෞරව),
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2023 මාර්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6279 –16 (2023/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ලැගුම්හල් හා නවාතැන් ස්ථාන නියාමනය සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ තාවකාලිකව නවාතැන් පහසුකම් ලබා දීම සඳහා පවත්වාගෙන යන ලැගුම්හල්, නවාතැන්, ගෙවල් වැනි ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම පාලනය කිරීම සඳහා පනවනු ලබයි.

*ලුහුඬු නාමය*

2. මෙම අතුරු ව්‍යවස්ථාව පැලියගොඩ නගර සභාවේ ලැගුම්හල් හා නවාතැන් ස්ථාන නියාමනය සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීමට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 157(9) උප වගන්තිය යටතේ නගර සභාවට බලය ලැබී ඇත.

*බලපත්‍රයක් ලබා ගත යුතු බවට*

4. පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය (මෙහි මින්මතු බල ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) තුළ කිසිදු තැනැත්තෙකු විසින් සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගත් බලපත්‍රයක් යටතේ මිස (මෙහි මින්මතු පරිශ්‍රය යනුවෙන් හඳුන්වනු ලබන) ලැගුම්හලක් හෝ නවාතැන් ගෙයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

*බලපත්‍රයක් ඉල්ලුම් කිරීම*

5. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරනානුකූලව පිළියෙල කරන ලද අයදුම්පතක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතුය.

6. ඉහත වගන්තිය යටතේ වූ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීමෙන් ගෙනවිත් භාර දීමෙන් හෝ අවසර දී ඇති පරිදි විද්‍යුත් තැපෑලෙන් යොමු කිරීමෙන් ඉදිරිපත් කළ හැකිය.

*බලපත්‍රයක් සඳහා කොන්දේසි*

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(1) පරිශ්‍රයට අදාළ ඉදිකිරීම් එවැනි වූ පරමාර්ථයක් සඳහා අනුමත කරන සැලැස්මකට අනුකූලව ඉදිකර අනුකූලතා සහතිකයක් ලබා ඇති ඉදිකිරීම් විය යුතුය.

(2) ගොඩනැගිල්ලේ සෑම කාමරයකටම අදාළ වෙන් වෙන්ව වැසිකිළි හා නාන කාමර පහසුකම් තිබිය යුතු අතර බිම නිසි ලෙස නිමවා තිබිය යුතුය.

(3) සෑම ගොඩනැගිල්ලක් සඳහාම ආලින්දයක්, කළමනාකරණ කටයුතු සඳහා වන නිශ්චිත ස්ථානයක්, ආහාර ලබා ගැනීම සඳහා පහසුකම් සහිත ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් වැනි අවශ්‍යතාවයන්ගෙන් සමන්විත වී තිබිය යුතුය.

(4) බල ප්‍රදේශය තුළ නිරෝධානය හා රෝග වැළැක්වීමේ ආඥාපනතට අදාළ වන රෙගුලාසියක විධිවිධාන ක්‍රියාත්මක වන අවස්ථාවක දුරස්ථභාවය පවත්වාගැනීම ප්‍රමාණවත් වන ඉඩක් පවත්වා ගැනීමට හැකිවන පරිදි යුගල කාමර හෝ සමූහ කාමර ප්‍රමාණවත් වගී ප්‍රමාණයක් සහිතව පැවතිය යුතුය.

(5) බලපත්‍රය ඉල්ලුම් කරන්නාට අදාළ දේපළ සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතියක් හෝ භුක්තියක් පැවතිය යුතුය.

(6) සෑම නවාතැන් කාමරයක් සඳහාම නවාතැන්කරුවන්ට සිය බඩු බාහිරාදිය ආරක්ෂිතව පවත්වා ගැනීමට හැකිවෙන පරිදි පහසුකම් සපයා තිබිය යුතුය.

(7) හදිසි විදුලි බිඳ වැටීම් හා ජල සම්බන්ධතා බිඳවැටීම් සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි විදුලි ජනක යන්ත්‍ර හා ජලය ගබඩා කිරීමේ පහසුකම් තිබිය යුතුය.

(8) නවාතැන්කරුවන්ගේ වාහන නවතා තැබිය හැකිවන පරිදි ප්‍රමාණවත් ඉඩපහසුකම් තිබිය යුතුය.

(9) ආබාධ සහිත අය විශේෂ අවශ්‍යතා සහිත අය සඳහා නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රවේශයට අදාළ පහසුකම් විය යුතුය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත්වන ඉල්ලුම් පත්‍රයකට අදාළව ඉල්ලුම් පත්‍රය ලැබී දින දහහතරක් ඇතුළත සභාපතිවරයා විසින් : *බලපත්‍රයක් නිකුත් කිරීම*

(1) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල වන විටදී පරිශ්‍රයට අදාළ බලපත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතුය.

(2) 7 වන වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන්නේනම්, හේතු දන්වා අදාළ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතුය.

9. (1) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සභාව විසින් තීරණය කර ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තු විය යුතුය. *බලපත්‍රයක් සඳහා ගාස්තු*

(2) බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළව ස්ථාන පරීක්ෂාවන් සඳහා වන පරීක්ෂණ ගාස්තුවක් සභාව විසින් තීරණය කර අය කිරීම නීත්‍යානුකූල විය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව කලින් අවලංගු නොකළහොත් බලපත්‍රයට අදාළ වර්ෂයෙහි දෙසැම්බර් තිස් එක දක්වා වලංගු විය යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙක්ම මෙහි පහත සඳහන් කොන්දේසීන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. *බලපත්‍රයට අදාළ කොන්දේසි*

(1) පරිශ්‍රය ලියාපදිංචි ව්‍යාපාරික නාමයක් යටතේ විය යුතු අතර එසේ නැතහොත් එය සංස්ථාගත ආයතනයක් වශයෙන් විය යුතුය.

(2) බලයලත් තැනැත්තා ආයතනයේ කළමනාකරුවෙකු නොවන්නේ නම්, කළමනාකරු සම්බන්ධයෙන් සභාපති විසින් ඉල්ලා සිටින අනන්‍යතාව පිළිබඳ තොරතුරු ලබාදී තිබිය යුතු අතර, වෙනස්වන සෑම අවස්ථාවකම එය එසේ ලබාදිය යුතුය.

(3) පරිශ්‍රය කිසිදු අවස්ථාවක උත්සව පැවැත්වීම ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගනිමින් ගීත ගායනා කිරීම, සංගීත භාණ්ඩ වාදනය කිරීම වැනි අන්‍යයන්ට බාධා වන ආකාරයේ කිසිදු ක්‍රියාවකට හෝ නීති විරෝධී කිසිදු ක්‍රියාවකට යොදා නොගත යුතුය.

(4) පරිශ්‍රයට පැමිණෙන වාහන කිසිවක් පොදු ප්‍රවේශයක නවතා නොතබන පරිදි වාහන නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් පවතින පරිදි පවත්වාගත යුතුය.

(5) නවාතැන් සඳහා පැමිණෙන සෑම තැනැත්තෙකුටම අදාලව නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය, හා සම්බන්ධ කරගත හැකි දුරකතන අංක මෙන්ම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් හෝ බල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ සභාපති විසින් හෝ බලප්‍රදේශයෙහි නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් සේවා අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් බල ප්‍රදේශයේ සෞඛ්‍ය හේතු මත හෝ වෙනත් කවර හෝ හේතු මත පවත්වාගත යුතුයැයි කලින් කල නියම කරන තොරතුරු ඇත්නම් ඒ සෑම තොරතුරක්ම ලේඛනගතව පවත්වාගත යුතුය. අදාළ තොරතුරු වසර තුනක් සංරක්ෂණය කළ යුතු අතර, පරිශ්‍රයෙහි ආරක්ෂක නිලධාරීන් බලප්‍රදේශයෙහි නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර දැඩි සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය.

(6) ශ්‍රී ලංකාව පුරාම හෝ ඉන් කොටසකට බල ප්‍රදේශයට අදාළව හෝ නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ සාදන ලද රෙගුලාසි යටතේ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර ඇති කවර හෝ අවස්ථාවක හෝ බල ප්‍රදේශය තුළ යම් වසංගත තත්ත්වයකට කරුණු යෙදී ඇති බවට සෑහීමට පත් වෙමින් එය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් මත සභාපතිවරයා විසින් කලින් කල නියම කරනු ලබන නියමයක් ඇත්නම් ඒ සෑම නියමයකටම යටත්ව පරිශ්‍රය පවත්වාගත යුතුය.

(7) නවාතැන් සඳහා වන කාමරයක් සහ නවාතැන්කරුවන්ගේ පරිහරණය සඳහා වන සෑම අවකාශයක්ම වැසිකිළි නාන කාමර එක් නවාතැන්කරුවෙකුගේ පරිහරණයෙන් පසු වෙනත් තැනැත්තෙකුගේ පරිහරණය සඳහා ලබා දීමට පෙර විෂබීජහරණය කළ යුතු අතර ගණුදෙනුකරුවන් රැඳී සිටියදී වුවද වැසිකිළි හා නාන කාමර දිනපතා විෂබීජහරණය කළ යුතුය.

(8) බල ප්‍රදේශයේ වසංගත රෝගී තත්වයන් සඳහා අවදානමක් ඇති බවට සැක කිරීමට කරුණු යෙදී ඇති සෑම අවස්ථාවකම පරිශ්‍රයේ නවාතැන් සඳහා පැමිණෙන සෑම තැනැත්තෙකු සම්බන්ධයෙන්ම ශරීර උෂ්ණත්වයට නියමිත පරාසය තුළ සිටින්නේද යන්න පරිශ්‍රයට ඇතුල්වීමට පූර්වයෙන් ඒ සඳහා නිශ්චිතව යොදවා ඇති අයකු විසින් මැන බැලිය යුතු අතර පරිශ්‍රයට ඇතුළත් කර ගැනීමට පූර්වයෙන් ඒ සෑම තැනැත්තෙකුගේ දෙඅත් සහ දෙපා විෂබීජනාශක යොදා පිරිසිදු කර ගැනීමට සැලැස්විය යුතුය.

(9) සෑම කාමරයකම ගණුදෙනුකරුවන්ගේ භාවිතය සඳහා තබා ඇති කොට්ට උර, ඇඳ ඇතිරිලි, පොරෝනා, තුවා ආදී නැවත භාවිතය සඳහා වන සියල්ල සෝදා පිරිසිදු කිරීමකින් තොරව තවත් ගණුදෙනුකරුවන්ගේ භාවිතය සඳහා යොදා නොගත යුතුය.

(10) කිසිදු ආකාරයකින් අදාල කාමරය තනි පුද්ගලයෙකු සඳහා වන කාමරයක් වනවිටදී වැඩිහිටි එක් අයකුට වඩා වැඩි සංඛ්‍යාවකට හෝ ද්විත්ව කාමරයක් වන විටදී වැඩිහිටි දෙදෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවකටද ත්‍රිත්ව කාමරයක් වන විටදී වැඩිහිටි තිදෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවකට හෝ සමූහ වශයෙන් රැඳී සිටිය හැකි කාමරයක් වන විටදී, එක් අයකුට වර්ග මීටර් හතරක් එක් අයකු සඳහා වන අවම ඉඩ වශයෙන් සැලකූ විට රැඳී සිටිය හැකි උපරිම සංඛ්‍යාව ඉක්මවා යන පරිදි වූ සංඛ්‍යාවකට කාමර පහසුකම් ලබා නොදිය යුතු අතර මෙම උප වගන්තියේ කාර්යය සඳහා වැඩිහිටි යන්න වයස අවුරුදු පහකට වැඩි අය සැලකිය යුතුය.

(11) කාමරයක් ඇතුළත ඇඳන් ඉහත (10) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රමාණයක් සැලකිල්ලට ගනිමින් පවත්වාගත යුතුය.

(12) දෙමව්පියන් හෝ නීත්‍යානුකූල භාරකාරිත්වයකින් හැර කිසිදු අවස්ථාවක ළමයෙක් සමඟ කවර හෝ තැනැත්තෙකුට ලැගුම් ගැනීම සඳහා අවසර නොදිය යුතුය.

(13) පරිශ්‍රයෙහි කාමර හැර විවෘත ප්‍රදේශයක කිසිදු අයකුට නිදා ගැනීම සඳහා භාවිතයට අවසර නොදිය යුතුය.

(14) අනන්‍යතාවය තහවුරු කිරීමට එකඟ නොවන්නේ නම් හෝ අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි කිසිදු තැනැත්තෙකුට පරිශ්‍රයෙහි නවාතැන් සඳහා අවසර නොදිය යුතු අතර නවාතැන් ලබන සියලුම අය සම්බන්ධයෙන් තොරතුරු ඔවුන්ගේ අත්සන් යටතේ වූ ප්‍රකාශයක් වශයෙන් විය යුතුය.

(15) වායු සමනය කරන ලද කාමරයක් නොවන විටදී සෑම කාමරයක් සඳහාම හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි කිසියම් කාලයක් දොර ජනෙල් විවෘත කර තැබීමෙන් පසු භාවිතය සඳහා ඉඩ දිය යුතුය.

(16) බල ප්‍රදේශයට අදාළව කිසියම් වසංගත තත්වයක් සම්බන්ධයෙන් නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥාපනත යටතේ රෙගුලාසියක් බල පැවැත්වෙන අවස්ථාවක එම රෙගුලාසියෙහි සඳහන් සෑම නියමයකටම අනුකූලව පරිශ්‍රය පවත්වා ගත යුතුය.

. (17) පරිශ්‍රය සඳහා විදුලි සම්බන්ධතාවය හදිසි බිඳවැටීමකදී අඛණ්ඩව විදුලිය සැපයීමට හැකිවන පරිදි විදුලි ජනන යන්ත්‍ර ස්ථිර ලෙස සවිකර තිබිය යුතුය.

(18) පරිශ්‍රය සඳහා වන ජල සම්බන්ධතාව හොඳින් පවත්වාගත යුතු අතර සෑම විටම ජලය ප්‍රමාණවත්ව ගබඩා කර ගත හැකි වන පරිදි පහසුකම් විය යුතුය.

(19) පරිශ්‍රයෙහි සේවය සඳහා ප්‍රමාණවත් සේවකයින් යොදවා තිබිය යුතු අතර ඔවුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි උපදෙස්වලට අනුකූලව සෞඛ්‍ය පරීක්ෂණයන්ට ලක් කළ යුතුය. එසේම ඔවුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශ කරනු ලබන කාලසීමාවක් යටතේ හෝ සායනික හෝ වසංගත වශයෙන් සඳහන් කළ හැකි කාලසීමාවක් යටතේ පරීක්ෂා කිරීම සඳහා කටයුතු කළ යුතුය.

(20) පරිශ්‍රයට අදාළ අපජලය, මළ අපද්‍රව්‍ය අවශ්‍ය බැවුම් සහිත අනුමත ක්‍රමවේදයන්ට අනුව පූතික වලවල්, උරා ගැනීමේ වලවල් හෝ මධ්‍ය ප්‍රතිකාර ඒකකයට යොමුකර තිබිය යුතු අතර ඒමගින් දූෂනය වීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබිය යුතුය. උරාගැනීමේ වලක් සෑම විටම ජල මූලාශ්‍රයක් ඇත්නම් එයට අවම වශයෙන් මීටර් 15, 25 ක දුරකින් විය යුතුය.

(21) පරිශ්‍රයෙහි අභ්‍යන්තර කාණු මනා ජල බැස්මක් සහිතව ඉදිකර තිබිය යුතු අතර දිනකට දෙවරක් විෂබීජ නාශක යොදා පිරිසිදු කළ යුතුය.

(22) (අ) බලපත්‍රලාභියා විසින් නවාතැන් ගන්නන් සඳහා පරිශ්‍රය තුළ පිසින ලද ආහාර සපයයි නම්,

(i) ආහාර සකස් කිරීමේදී භාවිතා කරන සියලු උපකරණ මෙවලම් කිසිදු විෂ ද්‍රව්‍යයක්, රසක් හෝ දුගඳක් ප්‍රේෂණය නොවන, අවශෝෂණය කර නොගන්නා ද්‍රව්‍යකින් සකස් වී තිබිය යුතු අතරම එය මල නොබැඳෙන ද්‍රව්‍යකින් සාදා තිබිය යුතුය.

(ii) ආහාර පිසීම සඳහා යොදා ගැනෙන සියලුම උපකරණ හා මෙවලම් පහසුවෙන් පිරිසිදු කළ හැකි ආකාරයේ ඒවා විය යුතුය.

(iii) අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා යොදා ඇති භාජන ලෝහ හෝ කාන්දු නොවන ද්‍රව්‍යන්ගෙන් සකස් කරන ලද පියන සහිත ඒවා විය යුතුය.

(iv) ආහාර පිසීම සඳහා පාවිච්චි කරන සෑම උපකරණයක්ම මෙවලමක්ම භාවිතා කිරීමට උචිත තත්වයේ ඒවා විය යුතුය.

(v) පරිශ්‍රය තුළ ආහාර සකස් කිරීම භාවිතා වන දේ තැබීම සඳහා හා පිසින ලද ආහාර එවැනි දේ තබා ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රමාණවත් ශීතකරණ පහසුකම් තිබිය යුතුය.

(vi) ආහාර සකස් කිරීමට ගන්නා පළතුරු එළවළු වැනි දේ ඉතා හොඳින් සෝදා පිරිසිදු කොට භාවිතයට ගත යුතුය.

(vii) පරිශ්‍රය තුළ පිසින ලද සෑම ආහාර ද්‍රව්‍යයක්ම උපද්‍රවයකින් තොරව නවාතැන් කරුවන් වෙත පත් කිරීම සඳහා නිශ්චිත අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකස්කර තිබිය යුතු අතර, එය නියාමනය කිරීම සඳහා නිශ්චිත කාර්යය පවරන ලද අය සේවයේ යොදවා තිබිය යුතුය.

(viii) ආහාරයට රැගෙන එන මස් මාළු පරිශ්‍රයෙහි වෙනම ශීතකරණයක ගබඩා කර තැබිය යුතු අතර භාවිතයට ගන්නා තෙක් සෙන්ටිග්‍රේට් අංශක දෙකක් තරම් වන උෂ්ණත්වයකින් යුතුව දූෂනය නොවන පරිදි පවත්වා ගත යුතුය.

(ix) පරිශ්‍රය තුළ ආහාර පිළිගැන්වීමේදී, පරිහරණය කිරීමේදී කාර්යයක නියලී සිටින සෑම තැනැත්තෙක් විසින්ම,

(අ) තම අත්ල හෝ ඇඟිලි විවෘත භාවයෙන් ආහාර ඇල්ලීම හෝ ස්පර්ශ කිරීම නොකළ යුතුය.

(ආ) කිසිදු ආකාරයක සේවයේ යෙදී සිටියදී මුදල් පරිහරණය කිරීමක් නොකළ යුතුය.

(ඇ) ආහාර ඇල්ලීම සඳහා භාවිතා කරන මෙවලම් හා අත්වැසුම් හිතකර භාවිතයක් විය යුතුය.

(ඈ) දෙ අත් පිසදමා ගැනීම සඳහා පිරිසිදු තුවායක් භාවිතයට ගත යුතුය.

(ඉ) භාවිතයට ගැනෙන පිඟානක කෝප්පයක හෝ වෙනත් භාජනයක යටිපැත්ත කිසිදු ආහාරයක නොගැටෙන ලෙස සෑම විටම පවත්වා ගත යුතුය.

(ඊ) ආහාර බෙදීම සඳහා භාවිතයට ගනු ලබන සියලු උපකරණ මනා ලෙස පිරිසිදුව තබා ගත යුතු අතර, ඒ සියල්ල වෙන් වෙන් වශයෙන් භාජනවල බහා තැබිය යුතුය.

(උ) කිසිදු අකාරයකින් තම ක්‍රියාවකින්, භාජනයකින් ආහාරයක් දූහනය වීමට හෝ ක්ෂුද්‍ර ජීවීන් ව්‍යාප්ත වීමට හේතු නොවන පරිදි ආහාර පරිහරණය කිරීමට සේවයේ යෙදී සිටින්නන් ක්‍රියා කළ යුතුය.

(ඌ) ආහාර පිරිසැකසුම් ක්‍රියාවලියට අදාළ වන ස්වස්ථතා නියමයන් පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.

(x) බල ප්‍රදේශය තුළ නිරෝධායක හා රෝග වැළැක්වීම් ආඥාපනත යටතේ ඒ යටතේ සාදන රෙගුලාසි යටතට අදාළ වන්නේ කවර හෝ වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත්කර හෝ බල ප්‍රදේශය තුළ කිසියම් වසංගත රෝගී තත්වයකට අවදානමක් ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක පරිශ්‍රය තුළ ආහාර සකස් කිරීම, පරිහරණය කිරීම පිළිගැන්වීම, කාර්යයෙහි නියුතු සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට අතිරේකව අවස්ථාවෝචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ ඔවුන්ගේ උපදෙස් පරිදි සභාපතිවරයා කරනු ලබන නියෝගයන්ට යටත්ව ක්‍රියා කළ යුතුය.

(xi) ආහාර පිළිගන්වන හා පරිහරණය සඳහා නිශ්චිත ස්ථානයක් පරිශ්‍රය තුළ තිබිය යුතු අතර එය සංවෘත අවකාශයක පහසුවෙන් වාතාශ්‍රය එන පරිදි හෝ වායු සමනය කර පවත්වාගත යුතුය.

(xii) ආහාර පරිහරණයට පූර්වයෙන් දෙඅත් පිරිසිදු කර ගැනීම සඳහා පහසුකම් සලසා සපයා තිබිය යුතුය. ප්‍රමාණවත් සබන් හා විෂබීජ නාශක දියර තබා තිබිය යුතු අතරම අත වියළීම සඳහා ද පහසුකම් විය යුතුය.

(xiii) ආහාර පිළිගැන්වීම සහ පරිහරණය සඳහා වන මේස ඉතා පිරිසිදු තාවයකින් විය යුතු අතර සෑම පිළිගැන්වීමකින් පසු විෂබීජ නාශක යොදා පිරිසිදු කළ යුතු අතරම, ඒ සඳහා භාවිතා වන තුවා පිරිසිදුතාවයෙන් විය යුතුය.

(23) පරිශ්‍රය තුළ ශ්වසන ආචාර විධි හා දෙඅත් පිරිසිදුභාවය නිතර පවත්වාගත යුතුය.

(24) මේස මත ආහාර වට්ටෝරු පොත් තැබීම වෙනුවට හැකිතාක් ආහාර වට්ටෝරු තිරයක් මත ප්‍රදර්ශනය වන පරිදි තැබිය යුතුය.

(25) සේවයේ යොදවන සේවකයින් සම්බන්ධයෙන් සෞඛ්‍ය නිරීක්ෂණ පද්ධතියක් පිහිටුවා ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබාගැනීමට ක්‍රියාවලියක් ඇති කිරීම කළ යුතුය.

(26) පරිශ්‍රය තුළ කිසිදු ආකාරයකින් බල්ලන්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම නොකළ යුතුය.

(27) පරිශ්‍රය තුළ එක් රැස්වන කසල සභාව විසින් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන කසළ කළමනාකරණය වැඩසටහන අනුව හා අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ බලපවත්වන ලිඛිත නීතියට අනුකූලව බැහැර කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබිය යුතුය.

(28) පරිශ්‍රයෙහි නවාතැන් සඳහා කිසිදු අවස්ථාවක යම් බෝවන රෝගී තත්වයකින් හෝ වසංගත රෝගී තත්වයකින් පෙළෙතැයි සිතිය හැකි තරම් කරුණු ඇති කවර හෝ තැනැත්තෙකු ඇතුළත් කර නොගත යුතුය.

(29) පරිශ්‍රයෙහි නවාතැන් ගෙන සිටින යම් තැනැත්තෙකුට හෝ පරිශ්‍රයෙහි සේවයෙහි යෙදෙන්නෙකුට බෝවන, ස්පර්ශයෙන් බෝවන, හෝ චර්මගත රෝගී තත්වයක් වැළඳුනහොත් ඒ බව බලපත්‍රලාභියා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතු අතර, එසේ දැනුම් දීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහු විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ලබා දෙන නිරෝධයක උපදෙස්වලට අනුකූලව පරිශ්‍රයට අදාළ සියලුම අය ක්‍රියාකළ යුතුය.

(30) පරිශ්‍රය නිරෝධායක ක්‍රියාවලියට යටත්කර ඇති විටක ඒකී නිරෝධායක කාලය අවසන් බවට වූ සහතිකයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකයෙකු විසින් නිකුත් කරනු ලැබීමෙන් පසු හා පරිශ්‍රය සම්පූර්ණයෙන් විෂබීජහරණය කරන තෙක් කිසිදු තැනැත්තෙකු නවාතැන් සඳහා ඇතුළත් කර නොගත යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පරිශ්‍රය පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිලධාරියෙකු ඕනෑම සාධාරණ වෙලාවක පරිශ්‍රයට ඇතුළු වීමට, අවශ්‍ය නියැදි ලබා ගැනිම නීත්‍යානුකූල වන්නේය. *පරිශ්‍රයට ඇතුළත්වීමේ බලය*

13. බල ප්‍රදේශය තුළ වසංගත තත්වයක් පැතිර යාමට හේතුවිය හැකි කරුණු සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී උපදෙස් පරිදි පරිශ්‍රය පවත්වාගෙන යාමට අදාළව බලපත්‍රලාභියා විසින් එකඟතා ප්‍රකාශයකට ඇතුළත් විය යුතු යැයි සභාපතිවරයා විසින් නියමකර ඇති විටකදී බලපත්‍රලත් තැනැත්තා සභාපතිවරයා සමඟ එකඟතා ප්‍රකාශයකට ඇතුළත් විය යුතු අතර සභාපතිවරයා විසින් එහි පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමුකළ යුතුය.

14\. (01) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් පරිශ්‍රයක් යටතේ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ ඊට පටහැනි වන පරිදි කටයුතු වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා දින තිහකට නොවැඩි නිශ්චිත කාලයක් දක්වමින් දැන්වීමක් සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත භාරදිය යුතුය.

(02) මෙම වගන්තිය යටතේ වූ දැන්වීමක් බලපත්‍රලාභියා වෙත භාරදීමෙන් පසු, අදාළ දැන්වීමේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා තවදුරටත් අතිරේක කාලයක් ලබාදෙන ලෙසට සාධාරණ හේතු දක්වමින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපතිවරයා විසින් අතිරේක කාලයක් ලබාදිය හැකිය. එසේ ලබාදෙන කාලය පළමු දැන්වීමේ සඳහන් කාලයට අතිරේකව දින දහ හතරක උපරිම කාලයකට යටත්ව විය යුතුය.

15. ඉහත 14 වගන්තිය යටතේ ලබාදෙන කාල සීමාව තුළ හෝ අතිරේක කාල සීමාව තුළ දැන්වීමට අනුකූලව ක්‍රියාකිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හැර ඇති අවස්ථාවක සභාපතිවරයා විසින් අදාළ බලපත්‍රය අවලංගු කළ යුතුය. *බලපත්‍රය අවලංගු කිරීම*

*දණ්ඩනය*

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගත යුතු බලපත්‍රයකින් තොරව හෝ අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන නියමයන් කඩකරමින් පරිශ්‍රයක් පවත්වාගෙන යාම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරුවෙකු කිරීමෙන් පසු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153(2) උප වගන්තිය යටතේ දඬුවමකට යටත් විය යුතුය. තවද එලෙස වරදකරුවෙකු වීමෙන් පසු තව දුරටත් එකී කඩකිරීම, උල්ලංඝනය නිරන්තරයෙන්ම කරගෙන යනු ලබන විට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දැන්වීමක් භාර දීමෙන් පසු උල්ලංඝනය තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනකට ඉහත කී 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153(2) උප වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතුය.

*අර්ථ නිරූපනය*

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වන්නේනම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් පැලියගොඩ නගර සභාවද,

"සභාපතිවරයා" යන්නෙන් පැලියගොඩ නගර සභාවේ තත්කාලයෙහි සභාපති ධූරය දරන්නා හෝ එම ධූරයේ කාර්යය භාරය ඉටුකරන අයද,

"බලය ලත් නිලධාරියා" යන්නෙන් පැලියගොඩ නගර සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධාරියෙක්ද

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් පැලියගොඩ නගර සභා බල ප්‍රදේශයට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයෙහි එම තනතුරට අදාළ අයද,

"ලැඟුම්හල් නවාතැන් ගෙවල්" යන්නෙන් කවර හෝ තැනැත්තෙකුට කිසියම් කාලයක් සඳහා තාවකාලික නවාතැන් සපයන ස්ථානයක්ද,

"මූලික නීතිය" යන්නෙන් 255 අධිකාරය වන නගර සභා ආඥාපනතද,
අදහස් වේ.

"සාධාරණ වේලාව" යන්නෙන් බලපත්‍රලත් කර්තව්‍ය හෝ ඊට අදාළ කාර්යන්හි නිරතවන ඕනෑම වේලාවක්ද,

*පාඨ අතර අනනුකූලතාවය*

18. අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයන් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

**උපලේඛනය**

**.......................... වර්ෂය සඳහා බලපත්‍ර ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

01. ඉල්ලුම්කරුගේ නම : -
02. පෞද්ගලික ලිපිනය : -
03. ජාතික හැඳුනුම්පත් අංකය : -
04. දුරකථන අංකය : - ජංගම : - ස්ථාවර : -
05. ව්‍යාපාරයේ ස්වභාවය : -
06. ආරම්භක වර්ෂය : -
07. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය : -
08. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : -
09. වරිපනම් අංකය: -
10. අනුමත සැලසුමෙහි අංකය හා දිනය:-
11. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය :-
12. ව්‍යාපාර ස්ථානයේ කළමණාකරුගේ හෝ නියෝජිතයාගේ,
    I. නම හා පෞද්ගලික ලිපිනය :-
    II. ජාතික හැඳුනුම්පත් අංකය :-
    III. දුරකථන අංකය ජංගම :- ස්ථාවර :-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ඉහත තොරතුරු සඳහන් ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය සඳහා .................... වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි.

දිනය:- ......................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ආදායම් පරීක්ෂක,

ඉල්ලුම්පත්‍රයට අදාළව වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් මා වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:- . ................................

ලේකම්

---

ලේකම්,

බලපත්‍රය ලබා දීම නිර්දේශ කරමි./නොකරමි.

**නිරීක්ෂණ :** ......................................................................................................................................................................

දිනය :- ..................................

ආදායම් පරීක්ෂක

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

පසුපිටේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අදාළව වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ කඩිනමින් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

දිනය :- ................................

ලේකම්

---

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,

අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් නීති රීතිවලට අනුකූලව සුදුසුකම් සපුරා ඇත./නැත. බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි./ නොකරමි.

සටහන :- ................................

දිනය :- ................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ලේකම්,

ඉහත ඉල්ලුම්පත්‍රයට අනුව අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි. / නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් ඊට අදාළ හේතුව සඳහන් කරන්න).

**නිරීක්ෂණ :** ......................................................................................................................................................................

දිනය :- ................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

---

වෙළඳ බලපත්‍රය නිකුත් කිරීම අනුමත කරමි.

................................
දිනය

................................
සභාපති,
පැලියගොඩ නගර සභාව.

EOG 04 - 0013

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.